INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: 2009 යුද්ධයේ භූමිකාව නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය ශ්‍රී ලාංකික සාම සාධක නිලධාරියකු ආපසු යවයි.**

2018 ඔක්තෝබර් මස 20 වැනිදා

ජොහැන්නස්බර්ග්: සාමසාධක නිලධාරියකු ආපසු ගෙන්වා ගන්නා ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය පළමු වතාවට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් ඉල්ලා තිබේ. ඊට හේතුව එරට සිවිල් යුද්ධයේ සිදුවූ බවට චෝදනා කෙරෙන යුද අපරාධ වලට ඔහුගේ ඇති සම්බන්ධයයි. "මෑතදී ලැබුණු තොරතුරු මත පදනම් වී" ලුතිනන් කර්නල් කලණ පී එල් අමුණුපුරට මාලි දේශය හැර යන ලෙස ඉල්ලා සිටින ලද බව එජා ප්‍රකාශකයකු විසින් සිකුරාදා ප්‍රකාශයට පත් කරන ලදී.

"අප විසින් සාමසාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුවට දෙන ලද තොරතුරු ගොනුව මේ පියවර ගැනීම සඳහා හේතු වී ඇති බව දැකීම අපේ මහත් සතුටට හේතුවෙයි," යනුවෙන් ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP)විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පවසයි.

"2009 යුද්ධයේදී මියගිය දසදහස් සංඛ්‍යාත දෙමළ ජනයා කොයිතරම්දැයි අපි තවමත් නොදනිමු. ඒ පිළිබඳව එකදු පුද්ගලයකුවත් වගවීමෙන් බැඳ නැත. යම් දිනයක යුක්තිය ළඟාවන බවට වින්දිතයන්ට යම් බලාපොරොත්තුවක් ඇති කර ගැනීමට මේ කුඩා පියවර හේතු වනු ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්භාවනීය රැකියා ලබා දී  යුද අපරාධ චූදිතයන් පිනවීම තව දුරටත් කළ නොහැකි බවටත්, දැඩි සෝදිසි කිරීමෙන් ගැලවී යා නොහැකි බවටත් ප්‍රබල පණිවිඩයක් මේ ක්‍රියාව මගින් ශ්‍රී ලංකාවට යැවෙනු ඇති බවට සැකයක් නැත," යි සූකා මහත්මිය පැවසුවාය.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියරේ දී 58 වැනි සේනාංකය යටතේ වූ 11 වැනි පාබල සේනාංකයේ  දෙවැනි අණදෙන නිලධාරියා ලෙස කටයුතු කළේ අමුණුපුරයි. 58 සේනාංකය එක්සත් ජාතීන්ගේ පරිශ්‍ර සහ රෝහල් වලට නොකඩවා ෂෙල් ගැසූ බවටත්, යටත් වූවන් ඝාතනය කළ සහ ඔවුන්ට වධහිංසා පැමිණවූ බවටත්, පිළිගත හැකි තොරතුරු 2015 එක්සත් ජාතීන්ගේ විමර්ශනයකින් හෙළි කරගෙන තිබේ. අමුණුපුරගේ ඒකකය 2009 පෙබරවාරියේ පුදුකුඩියිරුප්පු ප්‍රහාරයටත්, 2009 මාර්තුවේ පුදුමාතලන් ප්‍රහාරයටත් සම්බන්ධ බව

ආණ්ඩුවේද වාර්තා[1] ඇතුළු සමකාලීන මූලාශ්‍ර වල දැක්වේ. මේ ප්‍රහාර දෙකේදීම සාමාන්‍ය වැසියන්ට බරපතල හානි සිදුවිය. දැඩි ෂෙල් සහ වෙඩි ප්‍රහාර නිසා පුදුමාතලන්හි වෛද්‍යවරුන්ට මියගිය සහ මියයමින් සිටි පුද්ගලයන්ට ලඟා විය නොහැකිවූ ආකාරය එක්සත් ජාතීන්ගේ වාර්තාවේ සඳහන් කර තිබේ. පුදුමාතලන් හි සාමාන්‍ය වැසියන් බොහෝසෙයින් වාසය කළ ප්‍රදේශය අවට යුද හමුදාව එල්ල කළ ප්‍රහාරයේ බලපෑම, කලාතුරකින් ප්‍රසිද්ධ නිවේදන නිකුත් කරන ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් හඳුන්වනු ලැබුවේ “ව්‍යසනයක් මිස අන් කිසිවක් නොවේ”[2] යනුවෙනි.

මාලි දේශයේ ශ්‍රී ලංකා හමුද බලකායේ අණදෙන නිලධාරියා ලෙස අමුණුපුර යවනු ලැබුවේ 2017 දෙසැම්බරයේය. ඔහු පිටව යාමේ උත්සවයේදී, ශ්‍රී ලංකාවේ යුද හමුදපති විසින් එක්සත් ජාතීන්ගේ සේවයට යාම හඳුන්වා දෙන ලද්දේ යුද හමුදවේ වාර්තාවට ජාත්‍යන්තර වශයෙන් ලැබුණු සහතිකයක් ලෙසිනි[3].

“සිය 2009 කල්ක්‍රියාවෙන් ගැලවී යාමට හැකියාවක් ලැබුනු බව ඇඟවීම සඳහා සාමසාධනය යොද ගැනීමට ශ්‍රී ලංකාවට ඉඩ නොදිය යුතුය. අවුරුදු තුනකට ඉහතදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේදී හවුලේ අනුග්‍රහය දැක්වූ යෝජනාවකින් එකඟවූ පොරොන්දු අතර දෙමුහුන් අධිකරණයක් පිහිටුවීම මෙන්ම රජයේ සහ ආරක්ෂක අංශ නිලධාරීන් පූර්ව පරීක්ෂාවකට ලක් කිරීමද ඇතුලත් වේ. මේ පොරොන්දු ඉටු කර නැත,” යි සූකා මහත්මිය පැවසුවාය.

“2009 දී අමුණුපුරගේ අණදෙන නිලධාරියා වූ මේජර් ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා දැන් ශ්‍රී ලංකා යුද හමුදවේ විධායක ජනරාල් ධූරය ඉසිලීම කිසිසේත් අනුමත කළ නොහැක[4]. මෙයින් අදහස් වන්නේ යුද අපරාධ සම්බන්ධයෙන් වඩාත් කුප්‍රකට චූදිතයකු හමුදවේ මානව හිමිකම් අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය කරන අතර විදේශයකදී සාමසාධක භටයන් විසින් කෙරෙන කිසියම් උල්ලංඝනයක් පිළිබඳව විමර්ශන භාර නිලධාරියාද වන බවයි. මීට අමතරව 2009 යුද්ධයේ ආඥපති වරුන් ශ්‍රී ලංකා යුද්ධ හමුද සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය (IPSOTSL) ඇතුළු ස්ථානවලදී තරුණ පරපුරේ නිලධාරීන්ට පුහුණුව ලබා දී තිබේ. මෙය ප්‍රතිසංස්කරණ පිළිබඳ නිවැරදි පණිවිඩයක් ලබා නොදෙයි.”

මානව හිමිකම් පිළිබඳ පූර්ව පරීක්ෂාව සම්පූර්ණ නොකරන ලද යුද භටයන් ලෙබනන් බලා යැවීමට යුද හමුදව මේ වසරේ පෙබරවාරියේ උත්සාහ කළ අවස්ථාවේ ශ්‍රී ලංකාවේ සාමසාධක භටයන් මෙහෙයුම් වල යෙදවීම මුළුමනින්ම අත්හිටුවන ලදී. භට පිරිස් යෙදවීම 2018 දෙසැම්බරයේ නැවත ආරම්භ කරන බව යුද හමුදව විසින් නිවේදනය කර තිබේ.

ශ්‍රී ලංකා සාම සාධක භටයන් 134 ක් 2007 දී හයිටියෙන් ආපසු යවන ලද්දේ 2004 සිට 2007 දක්වා[5] අවුරුදු තුනක කාලයක් ඔවුන් ළමා ලිංගික සූරාකෑමට සංවිධානාත්මකව සම්බන්ධ වී සිටි බවට එක්සත් ජාතීන්ගේ විමර්ශනයකින් චෝදනා නැගීමෙන් පසුයි. ලුතිනන් ජෙනරල් අමුණුපුර 2004 දී හයිටි යවන ලද පළමු භට කණ්ඩායමේ සාමාජිකයෙකි. ඒ අපරාධ වලට චෝදනා ලබන්නන් සම්බන්ධයෙන් ගන්නා ලද විනයානුකූල පියවර පිළිබඳව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මේතාක් ලබා දී ඇත්තේ පරස්පර විරෝධී විස්තරය. මේ බරපතල අපරාධය සම්බන්ධයෙන් කිසිවකුත් සිරගත කොට නැත[6].

---

[1] https://reliefweb.int/report/sri-lanka/sri-lanka-largest-hostage-rescue-mission-world-launched

[2] A/HRC/30/CRP.2, Para 848.

[3] 'UN assignment in Mali endorses SL Army's international capabilities', 22 Dec 2017, Daily News, http://www.dailynews.lk/2017/12/22/local/138037/un-assignment-mali-endorses-sl-army's-internationalcapabilities

[4] PRESS RELEASE: SRI LANKA FLOUTS UN COMMITMENTS BY APPOINTING ALLEGED WAR CRIMINAL TO ADMINISTER ARMY http://www.itjpsl.com/assets/press/31-March-2017-ITJP-PRESS-RELEASE-3.pdf

[5] http://www.itjpsl.com/assets/press/haiti-FINAL.pdf

[6] Press Statement: Haiti: More than a decade and still hiding http://www.itjpsl.com/assets/press/Press-Statement-haiti-f.pdf

ආපසු හරවා යවන ලද සාමසාධක භටයන්ට දඬුවම් දඬුවම් කරන ලද්දේ කෙසේදැයි වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව (UNCAT) විසින් 2016 දී ශ්‍රී ලංකාවෙන් විමසන ලදී. අවුරුදු දෙකක් ගතවීත් ඒ තොරතුරු ලබා දී නැත[7].

[7] UNCAT letter 20 August 2018.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT